**'ජාතියක ආත්මය නිවසන්නේ එහි සරසවිය තුළය. ජාතියක ස්වරය නැගෙන්නේ එම සරසවි කෙරෙනි. ජාතියක විඥානය සංවර්ධනය විය යුත්තේ ද සරසවි කෙරෙනි. ජගත් සම්මේලනය මෙන් ගත් කළ මනුෂ්‍යයත්වයේ වැළපීම, සොම්නස, කතාබහ, චින්තනය ආදී සියල්ලේ සංකලනය වූ කලී ලොව විශ්වවිද්‍යාලයෝ ම වෙති'.**

හිටපු විදේශ අමාත්‍යවරයකු වූ දිවංගත ලක්ෂ්මන් කදිරගාමර් මහතාගේ සබරගමු විශ්වවිද්‍යාල උපාධි ප්‍රදානෝත්සව දේශනයේ ඉහත උපුටනය මෙම ලිපියට ප්‍රවේශයක් ලෙස ගැනීම මැනවි යැයි සිතමි. **'විශ්වවිද්‍යාලය' යන වචනාර්ථයේ බරසාරභාවය අනුව 'විශ්ව' යන්න දේශ දේශාන්තර ඉක්මවන පුළුල් අවකාශය යන්න අර්ථ ජනනය කරයි. 'විද්‍යාලය' හෙවත් විදුහල යන්න විද්‍යාව හෙවත් නව ඥානය උත්පාදනය කරන ආයතනය යන්න ගම්‍යමාන කරයි. මේ අනුව විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය හදාරන්නා හුදු සිසුවෙකු නොව විද්‍යාර්ථියා ය. විද්‍යාර්ථියා යනු විද්‍යාව හෙවත් නව ඥානය ගවේෂණය කරන්නා ය.**

මේ අනුව අප මනසේ සංකීර්ණ ගැටලු සමුදායක් පැන නගියි. එනම් නූතන විශ්වවිද්‍යාලයෙන් ඥාන ගවේෂණයක් සිදුවන්නේ ද? ආචාර්යවරුන්ගෙන් ඥාන උත්පාදනයක් සිදුවන්නේ ද? විශ්වවිද්‍යාල අධ්‍යාපනය යනු සටහන් කටපාඩම් කිරීම පමණ ද? පොත පතේ දැනුම නූතන ලෝකයට අනවශ්‍ය ද? වත්මන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරන්නා සැබෑ විද්‍යාර්ථියෙක් ද? මීට අමතර ව බොහෝ ගැටලු ඇති නමුත් ප්‍රමාණාත්මක අවකාශය තුළ සීමා වීමට සිදුවෙයි.

# පිං ඇති සරසවි යනු කිම බැදිවල ?

අධ්‍යාපන ක්ෂේත්‍රයේ මුදුන්මල්කඩ වන් විශ්වවිද්‍යාලය අද වන විට ඥාන ගවේෂණය සිදුකොට නව උත්පාදකයින් චින්තකයින් නන් වැදෑරුම් ක්ෂේත්‍රයන් හි නිපුණයින් වියතුන් බිහිකරනවා වෙනුවට රැකියා වෙළඳපොළට හුදු රොබෝ වෘත්තිකයින් බිහි කරන කම්හලක් බවට පත් ව ඇත. ඒ අනුව අද්‍යතන විද්‍යාර්ථීන් වසර ගණනාවක් පාසල් අධ්‍යාපනය හදාරා අතිශය තරඟකාරී අ.පො.ස උසස් පෙළ විභාගය සමත් ව විශ්වවිද්‍යාලයට පැමිණෙන්නේ රැකියාවකට යාමට බලපත්‍රයක් ලබා ගැනීම උදෙසා ය. එම බලපත්‍රය උපාධිය යි. පරිභෝජනවාදී ව්‍යුහය තුළ විද්‍යාර්ථීන් ආචාර්යවරුන් මතු නොව සකල ප්‍රජාවම පාරිභෝගිකයින් බවට පත්ව ඇත. එනිසා අසීමාන්තික අවශ්‍යතා සහ අතෘප්තිකර ආශාවන් පසුපස හඹා යන වත්මන් සමාජයට අවැසි වන්නේ මුදල් පමණි. එහෙයින් අධ්‍යාපනය ඇතුළු සියලු පුරුෂාර්ථ, හර පද්ධතීන් මෙන් ම මානව සබඳතා ඈ සියල්ලම වාණිජකරණයේ ඍජු ආධිපත්‍යයට නතු වී ඇත. එනයින් උපාධිය ද අවැසි වන්නේ රැකියාවක් කිරීමට මඟ සලසා ගැනීම සඳහා පමණි. ඛේදවාචකය ඇරඹෙන්නේ මෙතැනිනි. විශ්වවිද්‍යාලයක කාර්යභාරය රැකියාවලට බලපත්‍ර දීම ද?

**"විශ්වවිද්‍යාල ඇත්තේ උගතුන් බිහිකිරීමට ද රැකියා වෙළඳපොළ සඳහා සැපයීම් කිරීමට ද යන ප්‍රශ්නය නිරාකරණය කර ගත යුතු වේ. අද වන විට ක්‍රියාත්මක වන්නේ රැකියා වෙළඳපොළ මුල් කරගත් අධ්‍යාපන ක්‍රමවේදයක්. විෂය ඒකක ක්‍රමය ක්‍රියාත්මක කළෙත් ඒ සඳහා"**
(මහාචාර්ය සුනිල් ආරියරත්න - වටමඬල 15/02/26)

අතැම් පරිපාලකයන් කී පරිදි සරසවිය වසා ඇඟළුම් හල් දැමීම සුදුසු වන්නේ මේ කාරණයේ දී ය. ආචාර්ය ගුණදාස අමරසේකර කී පරිදි දැනුම නැති විශ්වවිද්‍යාලය වසා දමන්නැයි කළ ප්‍රකාශයේ අර්ථය වැටහෙන්නේ මෙතැන දී ය.

නූතන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් ඥාන උත්පාදනයක් සිදුවන්නේ ද යන්න මීළඟට පැන නගින ගැටලුවයි. විශ්වවිද්‍යාලයක් බැබළෙන්නේ ආචාර්යවරුන් විසින් නව සොයාගැනීම් නව පර්යේෂණ හා ඊට අදාළ ග්‍රන්ථකරණයන් සමාජගත කිරීම මගිනි. අනුව කියන්නන්ගෙන් විශ්වවිද්‍යාලයට පලක් නැත. මල්ටිමීඩියාවලට ම ලඝු වීම තුළ බොහෝ සරසවි ආචාර්යවරුන්ගේ දැනුම ක්ෂීණ වීමට ලක් වී තිබේ. එනයින් මෙය මල්ටිමීඩියානු සභ්‍යත්වය ලෙස නම් කිරීම උචිත ය. නව ආචාර්යවරුන් මල්ටිමීඩියා ක්‍රියා විරහිත වූ අවස්ථාවල සිය දේශනය නොකර පිට ව යන බව ඇතැම් මහාචාර්යවරුන් චෝදනා කරයි. නූතන සරසවි ආචාර්යවරුන්ට දැනුම නැති බව මහාචාර්ය විමල් ජී. බලගල්ලේ මහතා වරක් පුවත්පත් සාකච්ඡාවක දී ප්‍රකාශ කළේය. මෙසේ දැනුමෙන් අඩු විශ්වවිද්‍යාල ආචාර්යවරුන් බිහිවන්නේ කෙසේ ද? කුමන වරදින් ද? තත්ත්වය එසේ නම් විද්‍යාර්ථීන් ගැන කවර කතා ද? යකඩ මල්ලට ගුල්ලො ගහල නම් වී මල්ල නොබලාම වීසි කරනු. යන ජන කියමන සිහිපත් වන්නේ මෙතැන දී ය. වාද විවාද, සංවාද, මතවාද පවතින ඥානාගාරයක ප්‍රාර්ථනය අප හදවත් තුළ සිහිනයක් ව ලැගුම් ගනී.

දැනට විශ්වවිද්‍යාල තුළ ක්‍රියාත්මක වන්නේ සෙමෙස්තර ක්‍රමයකි. මෙම ක්‍රමය විද්‍යාර්ථීන් මෙන් ම ආචාර්වරයා ද දැඩි පීඩනයකට ලක් කොට තිබේ. මෙය බටහිර ප්‍රචලිත විශ්වවිද්‍යාල ඉගැන්වීම් ක්‍රමයකි. මෙය ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලවලට නොගැළපෙන්නේ බටහිර තරම් තාක්ෂණික දියුණුවක් ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලවල නොවන නිසාවෙනි. බටහිර විශ්වවිද්‍යාලයක දේශන කාමරයක ආචාර්යවරයා නොසිටිය ද දේශනය සිදු කිරීමට තරම් තාක්ෂණික දියුණුවක් තිබෙනවා මෙන් ම විද්‍යාර්ථීන්ට ලෝකයේ කොතැනක සිටියත් දේශනයට සහභාගී වීමට තාක්ෂණය නිසා හැකියාව ලැබේ. ශ්‍රී ලංකාවේ තත්ත්වය සපුරා වෙනස් අතර අත් වී ඇත්තේ පීඩනය පමණි. එහෙයින් මෙය එම ක්‍රමයේ වරද නොව ඊට අවශ්‍ය පහසුකම් සැපයීම අවශ්‍ය වේ. මෙම ක්‍රමයේ අනෙක් බරපතල ගැටලුව නම් සරසවි විද්‍යාර්ථීන් සංස්කෘතික දෙගිඩියාවකට පත් ව සිටීමයි. එහෙයින් විෂය බාහිර කටයුතුවල යෙදීමට විද්‍යාර්ථීයාට ඉඩ ප්‍රස්තාවන් අඩු ය. මෙම ක්‍රමයට එරෙහි ව කැරලි ගසා පලක් නැත. කළ යුත්තේ කෙසේ හෝ අධ්‍යයන කටයුතු මෙන් ම විෂය බාහිර කටයුතු සඳහා ඉඩ ප්‍රස්තා සැපයීම පිළිබඳ කාලය වෙන් කිරීම හෝ තාක්ෂණය දියුණු කිරීම ය. නැතිනම් ක්‍රමය වෙනස් කිරීම ය.

තත්ත්වය එසේ සිදුවන අතර නූතන සරසවි විද්‍යාර්ථීන් සියලු විෂය බාහිර ක්‍රියාකාරකම්වලින් ඈත් වෙමින් යයි. සරසවි කලාව සාහිත්‍යය ක්‍රීඩාව දේශපාලන සංවාද, විසංවාද, තර්ක, විතර්ක බාහිර ලෝක ප්‍රවණතා කෙරෙහි දක්වන අවධානය ඈ සියලු කටයුතුවලින් විනිර්මුක්ත ව වෙසෙයි. විශ්වවිද්‍යාලය දැඩි අධ්‍යාපනික සහ සංස්කෘතික පරිහානියකට පත් වන බව පැවසීමට අටුවා ටීකා අවශ්‍ය නැත. විද්‍යාර්ථීන් ආචාර්යවරයා ලබාදෙන සටහන කටපාඩම් කිරීම පමණක් සිදුකරයි. සරසවි භාෂාවෙන් 'ගිරවා දැමීම' පමණකි. ඊට එහා ගිය ගවේෂණයක් සිදු නොවන අතර අද වන විට විද්‍යාර්ථීන් දැනුම නොව ලකුණු පමණක් හඹා යන මාරාන්තික තරගකාරීත්වයකට පත් ව සිටී. එනිසා සමාසිකයෙන් සමාසිකයට උගත් දේ අමතක කරමින් එදිනෙදාට අවශ්‍ය ලකුණු පමණක් රැස්කර ගැනීම සිදු වේ. **"හැම විෂයක්ම උලා කෑමක් විනා කිසිම විෂයක් පිළිබඳ ගැඹුරු දැනුම මේ විෂය ඒකක ක්‍රමය නිසා විද්‍යාර්ථීන්ට ලැබෙන්නේ නෑ"**
(මහාචාර්ය සුනිල් ආරියරත්න/වටමඬල 15/02/26)

මෙය පිළිගැනීමට අකමැති එහෙත් සැබෑ යථාර්ථයයි. ඥාන විහීන විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් කවර අරුතක් ද?

මෙහි ප්‍රතිඵල ඉතා භයානක ය. මෙසේ බංකොලොත් වෙමින් පවතින්නේ රටේ උගත් යෞවන පරපුරයි. රටේ අනාගතයයි. අද වන විට විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් නොමනා පිරිසක් ලෙස කිසිවෙකු විසින් හංවඩු ගසනවානම් විද්‍යාර්ථීන්ගේ හැසිරීම අමනෝඥ නම් එසේ සිදු ව ඇත්තේ කවර වරදින් ද යන්න විමසා බැලීම මැනවි. මේ සඳහා එක් හේතුවක් පමණක් බලපාන්නේ නැත. විවිධ සමාජ ආර්ථික දේශපාලන හේතු බලපෑ හැක. එය කුමක්දැයි විමසීම වැදගත් ය. එය විමසීම වැඩිහිටි වියතුන්ට බාර ය. නූතන සරසවි විද්‍යාර්ථීන් සාහිත්‍ය කලා කටයුතුවලින් ඈත් වී ඇත. අතාර්කික මනසකින් යුත් විද්‍යාර්ථීන් ඕනෑම බලවේගයකට හසු ව නොමග යා හැකිය. "අපදාන සෝභිනී පඤ්ඤා" චරිතයෙන් පුද්ගලයාගේ ප්‍රඥාව ප්‍රකට වේ යන වැකිය අනුව මේ විශද වන්නේ විද්‍යාර්ථීන්ගේ

ප්‍රඥා මහිමයේ තරම යි. එය ඕනෑම තරාතිරමක පුද්ගලයෙකුට අදාළ වේ. නූතන විද්‍යාර්ථීන් නව දැනුම ගවේෂණය නොකරයි. නව අත්හදා බැලීම් නොකරයි. ඔවුන් සමාජයේ හුදු කුප්‍රසිද්ධ විකලාව කලාව ලෙස පිළිගැනීමට තරම් අන්ධ වී සිටිති. විශ්වවිද්‍යාල විද්‍යාර්ථියා සමාජයේ සෙසු ප්‍රජාව අතර වැදගතෙකු වන්නේ අගනා චරිතයෙන් සහ ප්‍රඥා මහිමය නිසාය.

නූතන විද්‍යාර්ථීන් තුළ ප්‍රඥාවන්තයා සැඟ ව සමාජ විරෝධියකු මතුවන්නේ නම් සිදුවන්නේ කුමක් ද? අසම්පූර්ණ අධ්‍යාපනයෙන්, විෂය බාහිර ප්‍රායෝගිකත්වය නොමැතිකමින්, සාහිත කලාවන් කෙරෙහි යෙදීමට ඉඩ ප්‍රස්තා අහිමි කිරීමෙන් සහ තාරුණ්‍යය තේරුම් නොගැනීමෙන් මනෝ ව්‍යාධියකට ලක් වූ යොවුන් පරපුරක් සමාජයට බිහි වේ. මෙම පිරිස් සමාජගත වී සිදු කරන්නේ ද සමාජ විරෝධී ක්‍රියා ය. ඔවුන් තුළ ආත්ම ශක්තිය මනුෂ්‍යත්වය සිඳී ගොසිනි. නව නිර්මාණ නව චින්තනයෙන් විනිර්මුක්ත පඹගාලේ පැටලුණු අංශභාගී විද්‍යාර්ථීන්ට වගකිව යුත්තෝ කවරහු ද?

අද වන විට විද්‍යාර්ථීන් මතු නොව බොහෝ අචාර්යවරුන් ද අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩි පිරිසක් සාහිත කලාව හඳුනන්නේවත් නැත. ඔවුන් අඥානයින් ය. ලූකාස් කී පරිදි අඥානභාවය යනු නූගත්කම නොව අලුතින් දකින්නට බැරිකම යි. එතරම් ම ඔවුන් යාන්ත්‍රීකරණය වී ඇත.

**යන්ත්‍රානුසාරයෙන් ලොව විටෙක අවදි වෙයි**
**දුව පනියි කයි අඳියි වැඩ කරයි ගිලන් වෙයි**
**යන්ත්‍රානුසාරයෙන් හඬයි හිනැහෙයි තැවෙයි**
**යන්ත්‍රානුසාරයෙන් ලොවක් ගමනෙහි යෙදෙයි**

(තිලකරත්න කුරුවිට බණ්ඩාර - "දෙවියෝ තැතිගෙන මහපොළොවට එති" කාව්‍ය සංග්‍රහය)

අද වන විට බොහෝ විශ්වවිද්‍යාල බටහිර අනුකාරක තත්ත්වයට පත් ව ඇති බව පෙනේ. එය කෙතරම් අනුකාරක ද යත් ලාංකීය සභ්‍යත්වය සංස්කෘතිය හංග වී යන ලෙසින් ම පරගැතිභාවයක් පෙන්වයි. ඕනෑම සංවර්ධනයක් පිළිගත්තාට වරදක් නැත. එහෙත් අනන්‍යතාව ගිලිහී යාමට ඉඩ දිය යුතු නැත. අපට අනන්‍ය පුරුෂාර්ථ සහ හර පද්ධතීන් විනාශ වන්නේ නම් අධානග්‍රාහී බවින් එම විනාශකාරී සංවර්ධනයට ගැති වී සිටී නම් අත්වන්නේ විපතක් ම පමණකි.

නූතන ලෝකයට පොතපතේ දැනුම අවශ්‍ය ද යන්න මීළඟට වැදගත් කරුණකි. අද වන විට දැනුම පාළු පොත් රාක්කවලින් එළියට පැන නිදහස් අවකාශයේ සැරිසරයි. දැනුම ඕනෑතරම් ය. එහෙත් එම දැනුම පාවිච්චි කර ඉවත දැමිය හැකි මෙවලමක් බවට පත් වී තිබේ. එයින් නූතන ශ්‍රී ලාංකීය විද්‍යාර්ථීන් මතු නොව හුදු මිනිසුන් අල්පශ්‍රැතයින් බවට පත් ව ඇත. ලෝක දෘෂ්ටිය පටු නායකයින් දේශපාලනඥයින් නිසා සකල සමාජ සංස්ථාව ම ගැහැට විඳින්නේ ඔවුන් අඥානයින් නිසා ය. "කියවීම මිනිසා සම්පූර්ණ කරයි" යන සුප්‍රසිද්ධ කියමනෙහි අර්ථය වන්නේ ප්‍රඥා මහිමයෙන් යුතු ව මිනිසුන් අගතියට ලක් නොවී ජීවත් වීමෙහි රහස පොත් අතර සැඟවී ඇති බවයි. එනිසා ඥාන කෝෂ්ඨාගාරයක් බවට විශ්වවිද්‍යාලය පත්වීම අනිවාර්ය වේ. මෙම ඥාන කේන්ද්‍රස්ථානය රැකගැනීම සියලු වියතුන්ගේත් විද්‍යාර්ථීන්ගේත් සියලු මහජනයාගේත් වගකීම විය යුතුය. ඒ සඳහා තම තමන්ගෙන් සිදුවිය යුතු කාර්යභාරය හඳුනාගැනීමත් යුතුකම හා වගකීම තේරුම් ගැනීමත් විශ්වවිද්‍යාලය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමට ඉඩ සලසන්නේ ය.

**සමන්ත කරුණානායක**

